

# බ්‍රහ්ම චරියාව සහ ළමා අපයෝජනය

මාතෘකාව හෝ එහි වැදගැම්ම මා විසින් නිර්මාණය කරන ලද්දක් නොවේ. මේ රටේ ක්‍රිස්තියානි - විශේෂයෙන් කතෝලික - පූජකවරුන් යටතේ සිදුවී ඇතැයි කියන ලද ළමා අපචාර පිළිබඳ කොමිෂන් සභාව විසින් අනාවරණය කරන ලද යථාර්ථය යි. යටත් පිරිසෙයින් තත්වය එබඳු බව මෙරට බොහෝ දෙනා පිළිගනිති.

එය අපට අදාල වන්නේ කෙසේදැයි ප්‍රශ්නයක් මතු වන්නටත් ඉඩ ඇත. මා වැනි බෞද්ධ ගිහියන් ඒ ගැන උනන්දු විය යුතුද? එක් අතකින් මෙරට පුරවැසියන් හැටියට රට තුළ සිදුවන කවර දෙයක් වුවද අපේ අවධානයට ලක්වීම අනිවාර්ය ය - අවශ්‍යය. අනෙක් අතට අප ඇති දැඩි වූ සමාජයේ දක්නට ලැබුණු සාමාන්‍ය චර්යාවක් වූයේ අනගාරිකයන් නමින් පෙනී සිටින අය කෙසේ වුවද නිවන් මගට පිවිසෙනු වස් සිවුරු දරා ගත් මහ සඟ රුවනට හුරු පුරුදු වූ - අත්‍යවශ්‍ය වූ චර්යාව බ්‍රහ්මචර්යාව වීම ය.

කිතු දහම හෝ පූජක චර්යාව ගැන හරි හැටි නොදැන මේ ප්‍රශ්නය විමසීමට සිතීම වුවත් සැක කටයුතු ක්‍රියාවක් වනු ඇත. ඒ නිසා එසේ නොදන්නාකම කල් තියාම පිළිගෙන ලියන එක ඇඟට ගුණය.

පළමු කොට කතෝලික පූජකවරුන් බ්‍රහ්මචර්යාව පිළිබඳ ප්‍රතිඥාවක් ගන්නේ කවර හේතුවක් නිසාදැයි මම නොදනිමි. ඒ කාමාශාව නම් වූ ක්ලේශ ධර්මය නැසීමට යටපත් කිරීමට නොවන බව මම අනුමාණ කරමි. මට සිතාගත හැක්කේ එහෙම අරමුණකට වඩා දෙවියන් වහන්සේගේ සේවය උදෙසා සිය දිවිය කැප කිරීම පහසු වනු වස් කරන්නක් බවය. පවුල් පන්සල් ගැන හිස මෙහෙයවීමෙන් ඒ කියන රාජකාරිය ට බාධා ඇතිවීම අනිවාර්ය ය. රකින්නට දරු පවුලක් නැතිවිට සිය පූර්ණ අවධානය දේවකාරිය වෙනුවෙන් යොදා ගැනීම පහසුය.

මෙබඳු ප්‍රතිඥාවක් දුන්නත් පූජකයන් සිය දිවිය ගත කරන්නේ ගිහියන් අතරය. ඔවුන්ගේ වැඩ කටයුතු වලට උපදෙස් දෙමින්ය. ඒ අතර ක්‍රිස්තියානි පූජකයන් සමග සමීප ඇසුරක් පවත්වන පිරිස් ද ඇත . පල්ලියේ ගායනයට සහභාගි වන දරු දැරියෝ ඒ අතර මුල් තැන ගනිති. තවත් ළමා පිරිසක් පූජක පරිපාලනය යටතට පත්වන්නෝය. ඒ පල්ලිය යටතේ පවත්වා ගෙන යනු ලබන අනාථාගාර නොහොත් ළමා ආයතන ඔස්සේය. මෙබඳු ආයතන බොහෝ දුරට මෙරට අතීතයට අයත්ව තිබූ ඒවාය.
පරීක්ෂණයේදී අනාවරණය වූයේ ඒ ආයතන තුළ අතීතයේදී සිදු වූ - සිදු කළ අපචාර පිළිබඳ තොරතුරුය.

පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ දෙයාකාරයක ප්‍රතිචාර වෙසෙසා අගය කළ යුතු යයි සිතමි. එක් අතකින් පල්ලියේ ඉහළම තැන් වලින් ජනතාව වෙත - විශේෂයෙන් අපචාරයට භාජන වූවන් වෙත - දෙන ලද පණිවුඩයයි. ඒ වූ කලි තමන් අතින් හෝ තමන් යටතේ සිදුවූ අකටයුතු පිළිබඳ සමාව යැදීමක් බව කිව යුතුය. තමා කළ වරද පිළිගෙන සමාව යැදීම බොහෝ විට දක්නට නොලැබෙන විරල ක්‍රියාවකි. මොකක් හරි නිදහසට කරුණක් කියා ඇඟ බේරා ගැනීම අපට පුරුදු සච්චාරිත්‍රයයි. එය දේශපාලකයන් විසින් සමාජගත කරන ලද චාරිත්‍රයක් යයි ද කිව හැකිය.

ප්‍රතිචාරයේ දෙවන හිතකර ලක්ෂණය වූයේ අපචාරයට ගොදුරු වූවනට වන්දි ගෙවීමයි. පල්ලියේ මුදලින් ලක්ෂ ගණනක් එබඳු වන්දි ගෙවීම ස=හාවැය කරන ලද බව පෙනෙයි. ඒ ගෙවන ලද වන්දිය සමග දෙන ලද විශේෂ පොරොන්දුවක්ද විය. මින් මනතට එබඳු පවාර සිදු නොවීමට තමන් වග බලාගන්නා බව වගකිවයුතු තැන්වල සිටින පූජකවරු සෘජුවම කියා සිටියහ.

මට පෙනෙන ආකාරයට එය වුවත් අපට නුපුරුදු සුපිරි ගුණයකි.

මා සමග සරසවියේ සිටි පසුව ප්‍රකට වූ හාමුදුරු නමක් මට සිහිපත් වන්නේ නිතැතින්මය. 1950 දී පවත්වන ලද සාකච්ඡාවකදී උන්වහන්සේ විසින් කරන ලද අභීත ප්‍රකාශය.

“භික්ෂුවට විවාහ වීමට ඉඩ දිය යුතුය”

වෘත්තිය සමිති නායකයකු දබරැගිල්ල ඔසවා කරන අභියෝගයක් වගේම කරන ලද ප්‍රකාශයකි. විවාහ භික්ෂුන් පිළිබඳ සිහින දුටු තරුණ භික්ෂුව පසුව සුපේශල ශික්ෂාකාමී මහ තෙර නමක් විය. මට උන්වහන්සේ ඉන්පසුව මුණ ගැසී නැත. පුවත් මගින් තොරතුරු දැනගත්තා පමණි.

ආනන්ද හිමියන්ගේ ඒ කතාවෙන් (ගම නොකියන නිසා අඳුනා ගැනීම පහසු නැත) මා නිතැනින්ම යොමුවන්නේ අප මව්බිමේ වැඩ වසන මහා සංඝ රත්නය කෙරෙහිය. මගේ ගුරුවරුන් වූ ගලපාත මේධානන්ද හා හෙට්ටිමුල්ලේ වජිරබුද්ධි යන හිමිවරුන් හැරුණ විට මා ඇසුරු කළ බැල්ලපිටියේ සුමංගල මාපලගම විපුලසාර යන




භික්ෂුන් වහන්සේලාට අමතරව සුපිරි සඟ නමක් ලෙස මා සිහිපත් කරන කොජගම වාචිස්සර හිමියන්ද සඳහන් කළ යුතුය. මගේ සහෝදරයාද කලක් සිවුරේ සිටි නිසා මගේ ඇසුර හා දැනුම සැළකිය යුතු බව ද කියමි.

මා මේ තැත් කරන්නේ කෙළින්ම නාසයට අත නොයවා ඔළුව වටේ අත අරන් යන්නටය. හේතුව දැක්වීමද අවශ්‍ය නැත. එය අපට පුරුදු සම්ප්‍රදාය බව ද නොකිව යුතුය.

එක පාරටම මගේ හිතට නැගෙන්නේ සිසිල් දේශගුණය සහිත කඳුකර ගමක පිහිටි ඉංගිරිසි බංගලාවකි. නමින් අඩිෂම් ය. සුදු මිනිසකු විසින් ඉදිකරන ලද “අඩිෂම්” බංගලාව පිහිටා ඇත්තේ හපුතලේ ටවුමට ආසන්න භූමි භාගයකය. දැනට ක්‍රිස්තියානි නිකායකට අයත්ව තිබුණේ ඇති ඒ බංගලාව 1950 දශකයේ අයිතිව තිබුණේ රජයේ ඇමති ධුරයක් දැරූ කාන්තාවකට ය. ඒ කාන්තාව හොඳින් දන්නා කියන භික්ෂුවක් සහ දවස් භික්ෂුවක් ඒ බංගලාවේ එක් කාමරයක වෙඩි තැබීම පුහුණු වූහ. එහි ප්‍රතිඵල අදත් කාමරයේ බිත්තිවල ඇති බව කියනු ලැබේ. ඒ කාමරය ආගන්තුකයනට යාමට ඉඩ නොදී වසා ඇත.

වෙඩි තැබීමේ අභ්‍යාසය පවත්වන ලද්දේ 1959 බණ්ඩාරනායක ඝාතනයට පෙර බව සඳහන් කළ පමණින් සැළකිය යුතු අතීතයක් අනාවරණය වන්නේය. ඒ අතීතය අයත් වන චරියාවක්ද ඒ සමගම හෙළි දරවුවන්නේය. ඇමතිවරිය එක්තරා භික්ෂුවක් සමග දැඩි සබඳතාවක් පැවැත්වූ බව මුළු රටම දැන සිටි කරුණකි.

වට වංගුවේ යන ගමන නතර කොට තවත් කතාවක් කියමි. චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපති ධුරය දැරූ අවදියේ වැඩිදුර අධ්‍යාපනය සඳහා මෙහි පැමිණි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරිනියක් මට හමු වූවාය. හොඳ වේලාවට ඇගේ නම මම නොදනිමි. ඇය කියූ කතාව පවා අවංක නොවන්නකි. ඇය කතා කළේ සිය දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු බොහොමයක් සිදුවන පැරණි රාජධානියක් ගැනය. ඒ නගරයේ තැනක වළක් හෑරීමට පවා දෙපාර්තමේන්තුවට ඉඩ නොදෙන බලවත් කාන්තාවක් සිටි බවය ඇය කියා සිටියේ. මැතිනිය විතරක් ඇය අතේ දුරින් තබා ගැනීමට සමත්ව ඇති බවද කීවාය.

කවුද මේ කාන්තාව?

නගරයේ මූලික සිද්ධස්ථානයට අධිපති නායක හාමුදුරුවන්ගේ බලතල අතට ගත් කාන්තාවය.

ඒ කාන්තාව ගැනම මට ලස්සන කතාවක් අසන්නට ලැබුණේ මා රැගෙන රත්නපුර බලා රිය පදවාගෙන ගිය රියැදුරා ගෙනි. තරුණ රියැදුරෙක්. තමා වතාවක් කස්සප පාරේ පිහිටි පන්සලක උත්සවයකට කෙනකු රැගෙන ගිය බවත් එහිදී දුටු දර්ශනයක් - හරියටම නියතොත් දර්ශන දෙකක් - මට විස්තර කර දුන්නේය.

“ඔන්න නායක හාමුදුරුවෝ බෙන්ස් එකෙන් ආවා.”

මදක් බලා සිටි ඔහු කතාව සම්පූර්ණ කළේය.

“ටික වෙලාවක් යනකොට නායක හාමුදුරුවන්ගේ නෝනා තවත් බෙන්ස් එකකින් ආවා”

මේ කියන්නේ අර කියාපු නායක හාමුදුරුවන් ගැනමය. දවසක් අති පූජණීය යයි කියනු ලබන සිද්ධස්ථාන භාරව සිටියේ ඔය වාගේ භික්ෂුන් නම් මං පටන් ගත්තු බ්‍රහ්මචර්යාව කතාව තවත් දිගට අරන් යන එක විහිලුවකි.

